# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1643/36 - 2010 මාර්තු 04 වැනි බ්‍රහස්පතින්දා - 2010.03.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ කෝරළේපත්තු ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

පක්ෂ සාමාජිකත්වය අහෝසි වීම හේතු කොට ගෙන කෝරළේපත්තු ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

තාමෝදරම් උදයජීවදාස් නම් වූ සභිකයා අයත් වන තමිල් මක්කල් විඩුදලයි පුලිකල් නම් වූ, පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් ට, දින තිහක (30) කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයකු වශයෙන් තෝරා පත්කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ , ඒ පක්ෂයට අයත් ඒ කෝරළේපත්තු ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තේරී පත්වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තෙකු නාමයෝජනා කිරීමට, ඉහත කී ආඥාපනතේ 65 අ(2) වැනි වගන්තිය යටතේ මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තෙකු වන, තාමෝදරම් උදයජීවදාස් මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

කෝරළේපත්තු ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී තුරෙයිසිංගම් ක්‍රිෂ්ණානන්දලිංගම් වන මම, ( 262 වැනි අධිකාරය වූ ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, තාමෝදරම් උදයජීවදාස් මහතා කෝරළේපත්තු ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

ටී. ක්‍රිෂ්ණානන්දලිංගම්,
තේරීම්භාර නිලධාරී,
කෝරළේපත්තු ප්‍රාදේශීය සභාව.

2010 පෙබරවාරි මස 19 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
මඩකලපුව.

03-685/1

1A - G 12563— 380 (2010/03)

**(262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(1) වගන්තිය යටතේ කෝරළේපත්තු ප්‍රාදේශීය සභාවේ සභාපති ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

පක්ෂ සාමාජිකත්වය අහෝසි වීම හේතු කොට ගෙන කෝරළේපත්තු ප්‍රාදේශීය සභාවේ සභාපති ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 65 අ (1) වන වගන්තිය යටතේ, සභාපති වන තාමෝදරම් උදයජීවදාස් නම් වූ සභාපති අයත්වන්නා වූ, තමිල් මක්කල් විඩුදලයි පුලිකල් නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට, දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභාපති වශයෙන් තෝරා පත් කරගනු ලැබිය යුතු යයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, ඒ පක්ෂයට අයත් වන්නා වූ ද, ඒ කෝරළේපත්තු ප්‍රාදේශීය සභාවේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා තාමෝදරම් උදයජීවදාස් මහතා නම් කිරීමේ ස්වකීය තිරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

කෝරළේපත්තු ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි තුරෙයිසිංගම් ක්‍රිෂ්ණානන්දලිංගම් වන මම, ( 262 වැනි අධිකාරය වූ ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(1) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, තාමෝදරම් උදයජීවදාස් මහතා කෝරළේපත්තු ප්‍රාදේශීය සභාවේ සභාපති වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

ටී. ක්‍රිෂ්ණානන්දලිංගම්,
තේරීම්භාර නිලධාරි,
කෝරළේපත්තු ප්‍රාදේශීය සභාව.

2010 පෙබරවාරි මස 25 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
මඩකලපුව.

03-685/2

---

**(262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ එරාවූර්පත්තු ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

අවසරය ලබා නොගෙන මාස තුනක කාලසීමාවක් සභාවේ රැස්වීම්වලට සහභාගී නොවීම හේතු කොට ගෙන එරාවූර්පත්තු ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

පත්මනාදන් විජිදරන් නම් වූ සභිකයා අයත් වන තමිල් මක්කල් විඩුදලයි පුලිකල් නම් වූ, පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට, දින තිහක (30) කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයකු වශයෙන් තෝරා පත්කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ , ඒ පක්ෂයට අයත් ඒ එරාවූර්පත්තු ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තේරී පත්වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තෙකු නාමයෝජනා කිරීමට, ඉහත කී ආඥාපනතේ 65 අ(2) වැනි වගන්තිය යටතේ මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තෙකු වන, කන්දයියා කාන්තන් මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

එරාවූර්පත්තු ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි තුරෙයිසිංගම් ක්‍රිෂ්ණානන්දලිංගම් වන මම, ( 262 වැනි අධිකාරය වූ ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, කන්දයියා කාන්තන් මහතා එරාවූර්පත්තු ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

ටී. ක්‍රිෂ්ණානන්දලිංගම්,
තේරීම්භාර නිලධාරි,
එරාවූර්පත්තු ප්‍රාදේශීය සභාව.

2010 පෙබරවාරි මස 25 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
මඩකලපුව.

03-686

**(262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ පොතුවිල් ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

අවසරය ලබා නොගෙන මාස තුනක කාලසීමාවක් සභාවේ රැස්වීම්වලට සහභාගී නොවීම හේතු කොට ගෙන පොතුවිල් ප්‍රාදේශීය සභාවේ සභිකයෙකුගේ ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

පඩිසම් සුදාහරන් නම් වූ සභිකයා අයත් වන ඉලංකයි තමිල් අරසු කච්චි නම් වූ, පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් ට, දින තිහක (30) කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයකු වශයෙන් තෝරා පත්කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ , ඒ පක්ෂයට අයත් ඒ පොතුවිල් ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තේරී පත්වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තෙකු නාමයෝජනා කිරීමට, ඉහත කී ආඥාපනතේ 65 අ(2) වැනි වගන්තිය යටතේ මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තෙකු වන, තංගරාසා පුෂ්පරාසා මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

පොතුවිල් ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී එම්. එම්. එස්. කේ. බණ්ඩාර මාපා වන මම, ( 262 වැනි අධිකාරය වූ ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, තංගරාසා පුෂ්පරාසා මහතා පොතුවිල් ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

එම්. එම්. එස්. කේ. බණ්ඩාර මාපා,
තේරීම්භාර නිලධාරී,
පොතුවිල් ප්‍රාදේශීය සභාව.

2010 පෙබරවාරි මස 22 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
අම්පාර.

03-687

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.